# 20. උදවු කරමු

තද වැස්සක් ඇති විය. මේ නිසා ගංවතුර ගැලුවේ ය. බොහෝ දෙනෙක් කරදරයට පත් වූහ. කිහිප දෙනකුගේ ගෙවල් දොරවල් විනාශ විය. තවත් කිහිප දෙනකුගේ සම්පත් විනාශ විය. ගමේ සෑම තැනක ම ලෙඩ රෝග පැතිර ගියේ ය. මේ ගැන සාකච්ඡා කිරීම සඳහා මස්ජිදයේ රැස්වීමක් පැවැත්විණි. එහි දී කතීබ්තුමා පහත සඳහන් අන්දමට කතාවක් පැවැත්වී ය.



"සහෝදරවරුනි, අපේ ගමේ ගංවතුරෙන් විපතට පත් වූ අයට, අප සෑම කෙනෙක් ම උදවු කළ යුතු ය. අල්ලාහ්, අප අතර සිටින සමහරෙකුට මුදල් සම්පත දී තිබෙනවා. තව සමහරෙකුට අධ්‍යාපන සම්පත දී තිබෙනවා. තවත් සමහරෙකුට නිරෝගීකම දී තිබෙනවා. මේවා ප්‍රයෝජනයට ගෙන අන් අයට උදවු කරන අයට අල්ලාහ් ඉතා ම කැමතියි"

එම රැස්වීමට පැමිණි සලීම් හාජියාර්, කතීබ්තුමාගේ අතට විශාල මුදලක් දුන්නේ ය. ගංවතුරෙන් අනාථ වූවන්ට අවශ්‍ය දේ මිලයට ගෙන දෙන ලෙස ඔහු ඉල්ලා සිටියේ ය. රෝගීන්ට නොමිලේ බෙහෙත් දිය හැකි බව එහි සිටි වෛද්‍යවරයෙක් කියා සිටියේ ය. රැස්වීමට පැමිණ සිටි තරුණයෝ කිහිප දෙනෙක් කැඩී ගිය ගෙවල් ශ්‍රමදානයෙන් අලුත්වැඩියා කර දීමට ඉදිරිපත් වූහ. වෙළෙඳසල් හිමියන්ගෙන් සමහරෙක්, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය දෙන බවටත්, තවත් සමහරෙක් මසන ලද ඇඳුම් දෙන බවටත් පොරොන්දු වූහ.

මෙවැනි අවස්ථාවල දී අපි ද අපට හැකි පමණින් උදවු කරමු.

## පැවරුම්

**වාක්‍ය සම්පූර්ණ කිරීමට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා අභ්‍යාස පොතේ ලියන්න.**

1. ගංවතුරෙන් අනාථවූවන් ගැන රැස්වීමක් පැවැත්වූයේ (නිවසේ දී/මස්ජිදයේ/පාසලේ දී) ය.
2. අනාථවූවන්ට උපකාර කළ යුතු යැයි ඉල්ලා සිටියේ (වෛද්‍යවරයා/කතීබ් තුමා/හාජියාර් තුමා) ය.
3. අනාථවූවන්ගේ නිවාස අලුත්වැඩියා කිරීමට ඉදිරිපත් වූයේ (තරුණයන්/වෙළෙන්දන්/වෙළෙඳ සල් හිමියන්) ය.
4. ගංවතුර ආදියෙන් පීඩා විඳින්නන්ට (උදවු කළ/උදවු නොකළ/කැමැති නම් උදවු කළ) යුතුයි.